# ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
## ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன
## Sri Lanka Podujana Peramuna

පොදුජන පැතුම වපුරන රන්කොත


2022 ජූලි 16

සාගර කාරියවසම් මහත්මා
මහ ලේකම්,
ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ,
නෙළුම් මාවත.

හිතවත් කාරියවසම් මහතාණනි,

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධුරය සඳහා වැඩබලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාට අපේක්ෂකත්වය ලබාදීමට සහය දැක්වීම සඳහා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ තීරණය කර ඇති බවට ඊයේ දිනයේ දී සියලුම මාධ්‍ය වෙත කළ ඔබේ ප්‍රකාශය පිළිබඳව මම විමතියට පත්වීමි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වැනි වගන්තිය සහ 1981 අංක 2 දරන ජනාධිපතිවරණ පනතේ අදාළ විධිවිධාන ප්‍රකාරව මැතිවරණය ජූලි 20 වැනි බදාදා පාර්ලිමේන්තුවේ දී පැවැත්වීමට නියමිත වේ.

මම ඔබෙන් මෙම කරුණු දැන ගැනීමට කැමැත්තෙමි.

(1) මෙම තීරණය ගනු ලැබුවේ කුමන අධිකාරිය යටතේද?
(2) මෙම තීරණය ගැනීම සඳහා සහභාගී වූ බව කියන පුද්ගලයින්ගේ නම්?
(3) මෙම පුද්ගලයින් තෝරා ගැනීමේ පදනම කවරේද?
(4) අපේක්ෂිත රැස්වීමේ ස්ථානය, දිනය සහ වේලාව?
(5) මෙම දැනුම් දීමේ දිනය සහ වේලාව ඇතුළුව මෙම අපේක්ෂිත රැස්වීම කැඳවන දැන්වීමට අදාළ විස්තර?
(6) ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ පක්ෂ ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙම තීරණය ගෙන ඇත්තේ කුමන පදනමක් මතද යන්න.

මෙයට ඉතා ඉක්මනින් පිළිතුරක් ලැබීමට මට අයිතියක් ඇතැයි මම සලකමි.

ඔබගේ නිවේදනයට ලබාදී ඇති පුළුල් ප්‍රචාරය සැලකිල්ලට ගනිමින් මෙම ලිපිය දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය වෙත නිකුත් කරමි.

මහාචාර්ය ජී.එල්. පීරිස්
සභාපති,
ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ.


නො. 1316, නෙළුම් මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. දුරකථනඃ +94 11 2866007
எண். 1316, நெலும் மாவத்தை, ஜெயந்திபுரம், பத்தரமுல்ல, இலங்கை. தொ.பேசி: +94 11 2866007
No. 1316, Nelum Mawatha, Jayanthipura, Battaramulla, Sri Lanka. Tel: +94 11 2866007
Email: info@slpp.org.lk